# ‘A Comparative Study of the *Yōgācāra* Idealist Traditional Teachings and Interdenominational Teachings on the Existence of Environmental Facts or *Dharmas*’

## පාරිසරික සාධක හෙවත් ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ යෝගාචාර විඥානවාදී සම්ප්‍රදායානුගත ඉගැන්වීම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.


Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි


## හැඳින්වීම

ලොව පවතින ජීවි-අජීවි සියලු වස්තූන්, පාරිසරික සාධක ලෙස දැක්වෙන අතර, මේ සියල්ල හැඳින්වීම සඳහා ථෙරවාද, සර්වාස්තිවාද ආදි වූ බෞද්ධ සම්ප්‍රදායයන්හි දැක්වෙන පොදු නාමය ***“ධර්ම”*** යන්නයි. නිකායාන්තර බුදුසමය තුළ ථෙරවාදය, සර්වාස්තිවාදය, සෞත්‍රාන්තික යන සම්ප්‍රදායයන් ධර්මයන්ගේ පැවැත්ම පිළිගනු ලබන අතර, මහායාන සම්ප්‍රදායට අයත් මධ්‍යමක, යෝගාචාර යන සම්ප්‍රදායයන් උක්ත ධර්මයන්ගේ පැවැත්ම ප්‍රතික්ෂේප කොට ඇත. මෙසේ නිකායාන්තරික මතවාදයන් තුළ ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ දක්වනුයේ පරස්පර විරෝධි මතවාදයන් ය. අපගේ මෙම ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍රිකාව මඟින් ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ යෝගාචාර විඥානවාදි ආකල්පය හා එම ඉගැන්වීම් අනෙකුත් සම්ප්‍රදායානුගත ඉගැන්වීම් සමඟ තුලනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## පාරිසරික සාධකන්ගේ (ධර්ම) පැවැත්ම පිළිබඳ නිකායාන්තරික විග්‍රහය

### ථෙරවාදය

ස්ථවිරවාද හෙවත් ථෙරවාද නිකාය තුළ සත්ව, පුද්ගල, ලෝක ආදී සියලු පාරිසරික සාධක හැඳින්වීම සඳහා සබ්බ, ලෝක, ධම්ම, සංඛාර ආදී පර්යාය පදයන් භාවිත කරනු ලබන අතර, මේවායේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ තුනක් ඔවුහු පෙන්වා දෙති.

01. උප්පාදක්ඛණ

02. ඨිතික්ඛණ

03. භංගක්ඛණ (*විසුද්ධිමග්ග,* සංස්. ධම්මානන්ද, එම්, පි. 620)

මෙහි ‘‘උප්පාදක්ඛණය’’ යනු ධර්මයන්ගේ පහළ වන අවස්ථාව යි. ‘‘ඨිතික්ඛණය’’ යනු එම ධර්මයන්ගේ පවතින කාලය යි. ‘‘භංගක්ඛණය’’ යනු විනාශ වන අවස්ථාව යි. මෙම විවරණයට අනුව ථෙරවාදීන් ඨිතික්ඛණ වශයෙන් ධර්මයේ පැවැත්ම අර්ථවත් කොට ඇත. එම නිසා ථෙරවාදය සත්වාදී දර්ශනයක් ලෙස දක්වේ. මුල් බුදුසමය තුළ ධර්මයෙහි පැවැත්ම පිළිබඳ දක්වා ඇති ***‘‘උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති’’*** (*අං.නි., තික නිපාතය,* බු.ජ.මු, පි. 274) යන අවස්ථා අතර ‘‘ඨිතස්ස අඤ්ඤථත්ථ’’ හෙවත් ධර්මය තිබූ ස්වරූපයෙන් වෙනත් ස්වරූපයකට පත්වීම ථෙරවාදයේ ‘‘ඨිතක්ඛණ’’ අවස්ථාවට සමාන වන අයුරු අංගුත්තර නිකාය අටුවාවේ (අං.නි., හේ.මු, පි. 56) සහ විශුද්ධිමාර්ගයෙහි ථෙරවාදීන් පෙන්වා දී ඇත. මෙම විවරණයන්ට

අනුව ධර්මයේ ඉපදීමත් නිරෝධයත් අතර කාලය ඨිතික්ඛණ නම් වේ. මෙම අවස්ථාව බාහිර ලෝකය පිළිබඳ ප්‍රත්‍යක්ෂය ලබාගැනීම සඳහා ඉවහල් වේ. ප්‍රත්‍යක්ෂය මානසික ක්‍රියාවකි. එසේ ම ප්‍රත්‍යක්ෂයට විෂය වන්නා වූ අරමුණ භෞතික ය. ථෙරවාදී සම්ප්‍රදායට අනුව චිත්තක්ෂණයට වඩා රූපක්ෂණය දීර්ඝ ය. රූපය පවතින එක් ක්ෂණයක දී චිත්තක්ෂණ දහසයක් ඉපිද නැතිවී යයි. රූපය චිත්තයාගේ දාහත්වන ක්ෂණයේ දී සිඳී යයි. (*විසුද්ධිමග්ග,* සංස්. ධම්මානන්ද, එම්, පි. 670) මෙසේ චිත්තක්ෂණයට වඩා රූපක්ෂණය දීර්ඝ වන බැවින් බාහිර ලෝකය පිළිබඳ ප්‍රත්‍යක්ෂය ථෙරවාදීහු පිළිගනිති. ඔවුන් එය ''බාහ්‍යාර්ථප්‍රත්‍යක්ෂවාදය'' ලෙස දක්වා ඇත.

එසේම ථෙරවාදීහු බාහිර ලෝක ප්‍රත්‍යක්ෂය තුළ ද්විසත්‍යවාදයක් ඉදිරිපත් කරති. එනම් සම්මුතිය සහ පරමාර්ථය යි. ***"බුද්ධස්සහි භගවතො ද්විධා දෙසනා සම්මුති දෙසනා පරමත්‍ථ දෙසනාචාති"***(*මනෝරථපූරණී,* හේ.මු., පි. 54) සම්මුතිය යනු බාහිර ලෝකය තුළ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වන සත්ත්ව, පුද්ගල ආදිය යි. ***"තත්‍ථ පුග්ගලො සත්තො ඉත්‍ථී පුරිසො ඛත්තියො බ්‍රාහ්මණො දෙවො මාරොති එව රූපා සම්මුති දෙසනා"***(*මනෝරථපූරණී,* හේ.මු., පි. 54) මෙයින් ලොව යථාර්ථය අර්ථවත් නොවන අතර හුදෙක් පුද්ගලයා තම සිත තුළ මවාගන්නා වූ ලෝකය සම්මුතියක් පමණක් බව දැක්වේ. ***"සංකෙත වචනං සච්චං ලොක සම්මුති කාරණා"*** (*මනෝරථපූරණී,* හේ.මු., පි. 54)

පරමාර්ථ සත්‍ය ලෙස ථෙරවාදීහු පෙන්වා දෙනුයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ස්ඛන්ධ, ධාතු, ආයතනාදී ධර්මයෝ ය. ***"අනිච්චං දුක්ඛං අනත්තා ඛන්ධා ධාතු ආයතනානි සතිපට්ඨානාති එව රූපං පරමත්‍ථ දෙසනා"*** (*මනෝරථපූරණී,* හේ.මු., පි. 54) මේ තුළ ලොව යථාර්ථය පිළිබිඹු වේ. ***"පරමත්‍ථ වචනං සච්චං - ධම්මානං භූත කාරණා"*** (*මනෝරථපූරණී,* හේ.මු., පි. 54) පරමාර්ථ සත්‍ය තුළින් ථෙරවාදීහු ධර්මයන්ගේ පැවැත්ම අර්ථවත් කොට ඇත. මෙසේ ථෙරවාද සම්ප්‍රදාය තුළ ආත්මාවරණය බැහැර කරනු ලබන අතර ධර්මාවරණය පරමාර්ථ සත්‍යය ලෙස දක්වා ඇත.

**සර්වාස්තිවාදය**

පාරිසරික සාධක හෙවත් ධර්ම පිළිබඳ සර්වාස්තිවාද සම්ප්‍රදාය තුළ ද පූර්ණ වූ විග්‍රහයක් දක්නට ඇත. සත්වාදී ආකල්පයක් ඍජුව දරන්නා වූ මෙම සම්ප්‍රදායෙහි මූලික ඉගැන්වීම වූයේ ත්‍රෛකාලීන ධර්ම අස්තිත්වය යි. ***"සර්‍වං සර්‍වදා අස්තීති සර්‍වාස්තිවාදඃ"*** (මේධානන්ද හිමි, දේවාලේගම, 1998, *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්,* ආරිය ප්‍රකාශන, වරකාපොල, පි. 36) මෙය මූලික සූත්‍රාගත දේශනාවන්ට ප්‍රතිවිරුද්ධ වූවකි. අනිත්‍යතා සිද්ධාන්තය පදනම් වූ මුල් බුදුසමය සියලු ධර්මයන්ගේ අනිත්‍යතාව නිරන්තරයෙන් අවධාරණය කොට ඇත. මෙයට පිළිතුරක් ලෙස සර්වාස්ථිවාදීහු ධර්මයන්හි පැවැත්ම පිළිබඳ ප්‍රධාන ලක්ෂණ දෙකක් පෙන්වා දෙති. ***"ස්වභාව සාමාන්‍ය ලක්‍ෂණං ධාරෙතීති ධර්මාඃ"*** **(එම, පි. 37)**

01. ස්වභාව ලක්ෂණය

02. සාමාන්‍ය ලක්ෂණය

ස්වභාව ලක්ෂණය යනු ධර්මයන්ගේ නොවෙනස්වන්නා වූ පදාර්ථය යි. මෙය අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයෙහි ම වෙනසකට භාජනය නොවේ. මෙම මතය තහවුරු කිරීම සඳහා සර්වාස්තිවාදීහු ධර්ම විෂයෙහි සාශ්‍රව සහ අනාශ්‍රව යනුවෙන් අවස්ථා දෙකක් දක්වයි. සාශ්‍රව යනු සංස්කෘත ධර්ම යි. අනාශ්‍රව යනු අසංස්කෘත ධර්ම යි. සංස්කෘත යන්නෙන් හේතු ප්‍රත්‍යව

හටගන්නා වූ සියල්ල අර්ථවත් වන අතර, මෙයින් අතීත කාලික ධර්ම අස්තීත්වයක් හඟවයි. ''කෘත'' යනු අතීත කාලික කෘදන්ත පදයකි. නමුත් මෙය තුළින් වර්තමාන, අනාගත කාලික ධර්ම අස්තීත්වයක් ද හැඟවේ. ''දුග්ධ'' යනු දොවන ලද කිරි හෙවත් කිරි යන්නට අපර නාමයකි. මෙයින් අතීත කාලික අදහසක් අර්ථවත් වූව ද, දෙවීමට පෙර පයෝධර වූවේ ද, දෙවූ අවස්ථාවේ දී කිරි වූවේ ද, දෙවූ පසු කිරි වූවේ ද එක ම පදාර්ථය යි. මෙම තර්කානුකූල පදනම මත ත්‍රෛකාලීන ධර්ම අස්තීත්වය පෙන්වා දෙන සර්වාස්තිවාදීහු ස්වමතය තහවුරු කිරීම උදෙසා **භාවාන්‍යතාවාද, අවස්ථාන්‍යතාවාද, ලක්‍ෂණාන්‍යතාවාද, අන්‍යථාන්‍යතාවාද** යනුවෙන් මතවාද සතරක් දක්වා ඇත.

සර්වාස්තිවාදීහු ධර්ම පිළිබඳ සාමාන්‍ය ලක්‍ෂණයක් ද පෙන්වා දෙති. මෙයට අනුව සියලු ධර්ම අවස්ථා 04 ක් නියෝජනය කරනු ලබයි.

01. ජාති - හටගැනීම

02. ස්ථිති - පැවැත්ම

03. ජරා - විනාශමුඛ වීම

04. වය - විනාශය

මෙහි ධර්මයක හටගැනීමක් ද, එහි පැවැත්මක් ද, විනාශයට යොමුවන අවස්ථාවක් ද, විනාශය ද දක්වේ. මෙහි දී මුල් බුදුසමයේ දක්වූ **''ඨිතස්ස අඤ්ඤතත්ථ''** සහ ථෙරවාදී ඨිතික්ඛණ, අවස්ථාව ද සර්වසතිවාදීහු ස්ථිති, ජරා වශයෙන් අවස්ථා දෙකක් තුළ පෙන්වා දී ඇත. මෙහි ඇති ''ස්ථිති'' අවස්ථාව මඟින් ධර්මයේ ඍජු පැවැත්මක් අර්ථවත් වන අතර, එම අවස්ථාව තුළ පුද්ගලයා ධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය නිර්මාණය කරගන්නා බව සර්වාස්තිවාදී මතයයි. මෙය **''බාහ්‍යාර්ථප්‍රත්‍යක්‍ෂවාදය''** නමින් දක්වා ඇත.

**සෞත්‍රාන්තික නිකාය**

මූලික සූත්‍ර දේශනා ප්‍රාමාණිකත්වයෙන් ගෙන කරුණු දක්වූවෝ සෞත්‍රාන්තිකයෝ වූහ. ***"යෙ සූත්‍ර ප්‍රමාණිකා නතු ශාස්ත්‍ර ප්‍රමාණිකා තෙ සෞත්‍රාන්තිකාර්ථඃ"***(නානායක්කාර, සනත්, 2003, *මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්,* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 76) ඔවුහු ධර්ම විෂයෙහි අවස්ථා දෙකක් පමණක් දක්වති. එනම්,

01. උප්පාද - ඉපදීම

02. වය - විනාශය

මෙය ඉගැන්වීම විෂයෙහි ඔවුහු මූලික සූත්‍රාගත මූල බීජ ඉදිරිපත් කොට ඇත. ***"අනිච්චාවත සංඛාරා උප්පාද වය ධම්මිනො"*** (දී.නි., මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු, පි. 246) ***"උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති"*** (දී.නි., මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු, පි. 246) ***"සමුදය ධම්මානුපස්සි විහරති වය ධම්මානුපස්සි විහරති"*** (සං.නි., මහාවග්ග පාළි, සතිපට්ඨාන සූත්‍රය, බු.ජ.මු, පි. 210) මෙසේ ධර්මයන්ගේ ඉපදීම සහ විනාශය පමණක් පෙන්වා දෙන සෞත්‍රාන්තික සම්ප්‍රදාය සියලු ධර්ම ක්‍ෂණයක් තුළ ඉපදී එම ක්‍ෂණය තුළ ම විනාශ වී යන බව දක්වමින් ක්‍ෂණවාදයක් නිර්මාණය කළේ ය. ***"ක්‍ෂණිකානාං නාස්ති දෙශාන්තර ගමනං යත්‍රෛව උප්පත්ති තත්‍රෛව විනාශං"*** (නානයක්කාර, සනත්, 2003, *මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල*

*හැඳින්වීමක්,* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 65) මෙම ක්‍ෂණවාදයට අනුව සියලු ධර්ම ක්‍ෂණයක් තුළ ඉපිද නිරෝධයට පත් වේ නම් එම ධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය කෙසේ ලබන්නේදැයි යන ගැටළුවට සෞත්‍රාන්තික පිළිතුර වූයේ සියලු ධර්ම අනුමානය තුළින් ප්‍රත්‍යක්‍ෂ කරගන්නා බව යි. ඉන්ද්‍රිය ද සිත ද ක්‍ෂණික වන බැවින් සිත දැනීම ලබන ක්‍ෂණය වන විට ඉන්ද්‍රිය තුළින් ලබන්නා වූ අරමුණ නැතිවී ගොස් ය. එබැවින් කිසිදින කිසිවෙකුට බාහිර ලොව ප්‍රත්‍යක්‍ෂ කරගත නොහැකි ය. ප්‍රත්‍යක්‍ෂක් නොමැත. ඇත්තේ අනුමානයක් පමණි. මෙය සෞත්‍රාන්තිකයෝ ''බාහ්‍යාර්ථඅනුමේයවාදය'' ලෙස දක්වූහ. මෙම ඉගැන්වීම මානසික ක්‍රියාවලියකි. පුද්ගලයා ඉන්ද්‍රිය මඟින් අරමුණු පිළිබඳ සංඥාව ලබා ගනී. විෂය වන්නේ සංඥාව පමණකි. මෙහි දී අරමුණු අතීතයට ගොස් හමාර ය. එබැවින් විෂය වූ සංඥාව මඟින් අරමුණු අනුමාන කරනු ලබයි.

සෞත්‍රාන්තික නිකාය බාහිර විෂය වස්තු ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ අනුමේයවාදයක් ඉදිරිපත් කළ ද එය, සර්වාස්තිවාදය මෙන් ම සත්වාදී ස්ථාවරයක පිහිටා ඇත. ස්වලක්‍ෂණමය වූ ධර්මස්වභාවය වාස්තවික සත්‍යයක් ලෙස ඔවුන් ද පිළිගෙන ඇත. එහි ප්‍රත්‍යක්‍ෂය පමණක් අනුමානය මඟින් සිදු කෙරේ.

**මාධ්‍යමක නිකාය**

මහායාන සම්ප්‍රදායට අයත් මාධ්‍යමක දර්ශනයත්, යෝගාචාර විඥානවාදයත් බොහෝ සංකල්ප විෂයෙහි සමානත්‍වයක් දරයි. ශූන්‍යතාවාදී දර්ශනයක් ඉදිරිපත් කරන්නා වූ ඔවුහු, සර්වාසතිවාදී හා සෞත්‍රාන්තික සම්ප්‍රදායයන් ද ධර්ම විෂයෙහි දක් වූ වාස්තවිකත්‍වය මෙන් ම වෛඥානිකත්‍වය යන අංශ ප්‍රතික්‍ෂේප කොට ආදි බුදුදහමෙහි දක්වෙන ප්‍රතීත්‍යසමුප්පාද න්‍යාය තුළින් ගොඩනගාගත් සර්ව ශූන්‍යතාවයක් පෙන්වා දුන්හ. "***යඃ ප්‍රතීත්‍යසමුත්පාදඃ ශූන්‍යතාං තාං ප්‍රචක්ෂ්මහෙ - යා ප්‍රඥප්තිරුපාදාය ප්‍රතිපත්සෙව මධ්‍යමා***" (*මූලමාධ්‍යමික කාරිකා.* ආර්යසත්‍ය පරීක්‍ෂා ප්‍රකරණ, 18 ශ්ලෝකය) ශූන්‍යතාවාදයට අනුව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය තුළ ගොඩනැගෙන්නා වූ සියලු භාවයන් ස්වභාව වශයෙන් ප්‍රතිබිම්භ හා සමාන ය. "***සර්වේභාවාඃ ස්වභාවෙන ප්‍රතිබිම්බ සමාමතාඃ***" (නාගාර්ජුන හිමි, 1963, මූල මාධ්‍යමික කාරිකා, (සංස්) ශසනරතන හිමි, මොරටුවේ, පී. ජේ. රුද්‍රිගෝ, පානදුර පි. 65) එය මායාවක්, සිහිනයක්, ගාන්ධර්ව නගරයක් සේ උපමා කොට ඇත. "***යථා මායා යථා ස්වප්නො - ගන්ධර්ව නගරං යථා, තථොත්පාදස්තථා ස්ථානං - තථා භඞග උදාහෘතම්***" (*මූලමාධ්‍යමික කාරිකා* . සංස්කෘත පරීක්‍ෂා ප්‍රකරණ, 34 ශ්ලෝකය) මෙම මාධ්‍යමික ඉගැන්වීම පුද්ගල නෛරාත්මය මෙන් ම, ධර්ම නෛරාත්මය ද තහවුරු කරන්නකි.

## ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ යෝගාචාර විඥානවාදි විග්‍රහය

**යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය**

ජීවය, විශ්වය, බෝධිපාක්‍ෂික ධර්ම, කාම රූප අරූප යන ත්‍රෛධාතුකය ආදී පාරිසරික සාධක සියල්ල විඥානය හෙවත් සිත තුළ ම නිර්මාණය වූ සිත ම පදනම් කොට ගත්තා වූ විඥප්තිමාත්‍රයක් බව දක්වන්නහු යෝගාචාර විඥානවාදීන් ලෙස පිළිගැනේ. ඔවුන්ගේ ඉගැන්වීම්වල මූල බීජය වී ඇත්තේ විඥානය යි. විඥානය හැර අන් කිසිවක් සත්‍ය වශයෙන් නොපවත්නා බව ද, මුළු විශ්වය ම බුද්ධිමය බව ද ඔවුහු දක්වති. ***''සර්වං බුද්ධිමයං ජගත්''*** එසේ ම විඥානය බාහිර විෂයයන් කෙරෙහි රඳා නොපවතින බවත්, එය ස්වයං උපස්ථිතියෙන් යුක්ත වන බවත්, යෝගාචාර මතය යි. එම නිසා යෝගාචාර දර්ශනය ''නිරාලම්බනවාදය'' ලෙස ද හැඳින්වේ.

''යෝගාචාර'' යනුවෙන් දක්වෙන්නේ මෙම නිකායෙහි ප්‍රායෝගික පැතිකඩ යි. සත්‍යාවබෝධය පිණිස යෝගයත්, ආචාරයත් එක සේ අවශ්‍ය බව මෙයින් අදහස් වෙයි. මෙහි ''යෝගය'' නම් යෝනිසෝ මනසිකාරය යි. සිහි නුවණින් යෙදී සියුම් ලෙස ගැඹුරට කල්පනා කිරීම යි. සත්‍යාසත්‍යතාවය මෙනෙහි කිරීම යි. තර්ක බුද්ධිය යොදමින් යම් කරුණක් පිළිබඳව විමති උපදවා විමර්ශනය කිරීම යි. ''ආචාරය'' යනු පරතෝඝෝෂය යි. එනම් ගුරුන්ගෙන් අසා දැන ගැනීම යි. එසේ ගුරුන්ගෙන් අසා දැනගත් යහපත් වූ උපදෙස් නොවෙනස්ව එලෙස ම ආරක්‍ෂා කොටගෙන ක්‍රියා කිරීම යි. මෙසේ විමංසන බුද්ධිය හෙවත් ''යෝගයත්'' ගුරු උපදේශය හෙවත් ''ආචාරයත්'' පිළිගත්තහු යෝගාචාරීහු නම් වෙති.

මහායාන බෞද්ධ දාර්ශනික චින්තනයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 4 වන සියවස තුළ යෝගාචාර විඥානවාදී දර්ශනය බිහි වී ඇත. ආචාර්ය අසංගපාදයන්ගේ දොළොස් වසරක යෝගාභ්‍යාසානුභූතියෙහි දාර්ශනික ප්‍රතිඵලයක් වූ මෙම විඥානවාදය ආචාර්ය වසුබන්ධු පාදයන්ගේ අතින් පෝෂණය වූවකි. ඇතැම් මූලාශ්‍රය සාධකයන්ට අනුව ආචාර්ය මෛත්‍රීනාථ පාදයන් මෙම සම්ප්‍රදායෙහි ආදී කර්තෘවරයා ලෙස සැලකේ. අසංග, වසුබන්ධු ආචාර්යවරුන්ගෙන් අනතුරුව ධර්මකීර්ති, දිංනාග ආචාර්යවරු මෙම දර්ශනය තවදුරටත් සංවර්ධනය කළ අතර පසු කාලීනව දිංනාග ශිෂ්‍ය වූ ශංකර ස්වාමි (ක්‍රි.ව. 500), ආචාර්ය ධර්මපාල (ක්‍රි.ව. 600), ආචාර්ය ශාලිභද්‍ර (ක්‍රි.ව. 635), ආචාර්ය දේවේන්ද්‍රබෝධි (ක්‍රි.ව. 650), ආචාර්ය ශාන්තරක්ෂිත (ක්‍රි.ව. 749), ආචාර්ය කමලශීල (ක්‍රි.ව. 750 ), ආචාර්ය කල්‍යාණරක්ෂි (ක්‍රි.ව. 829) ආචාර්ය ධර්මෝත්තර (ක්‍රි.ව. 889) යන ආචාර්යවරු විඥානවාදය විෂයෙහි නව අදහස් ඉදිරිපත් කරමින් තවදුරටත් මෙම දර්ශනය පෝෂණය කොට ඇත.

## යෝගාචාර විඥප්තිමාත්‍රතා සංකල්පය

නිකායාන්තර බුදුසමයෙහි දාර්ශනික චින්තනයන් විෂයෙහි පදනම් වූ පාරිසරික සාධකයන්ගේ පැවැත්ම හෙවත් 'ධම්ම' විග්‍රහය තුළ, ථෙරවාදී සම්ප්‍රදායෙහි දැක්වෙන්නා වූ පුද්ගල නෛරාත්මයත්, ධර්ම අස්තිත්වයත් "***යථාහි අංගසම්භාරා - හොති සද්දොරථො ඉති එවං ඛන්ධෙසු සන්තෙසු - හොති සත්තොති සම්මුති***" **(සං.නි., සගාථා වග්ග, භික්ඛුණී සංයුක්ත, වජිරා සුත්ත)** පදනම් වූ ධර්මවාදයත්, ඒ තුළ ඉස්මතු වන්නා වූ **"බාහ්‍යාර්ථප්‍රත්‍යක්‍ෂවාදය"** නම් වූ දාර්ශනික චින්තනය ද, සර්වාස්තිවාදී සම්ප්‍රදාය දක්වන්නා වූ සර්වකාලීන ධර්ම අස්තිත්වය ***"සර්වං සර්වදා අස්තීති සර්වාස්තිවාදඃ"*** **(මේධානන්ද හිමි, දේවාලේගම, 1998, *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්*, ආරිය ප්‍රකාශන, වරකාපොල, පි. 36)** පදනම් වූ ධර්මවාදී චින්තනය ද, සෞත්‍රාන්තිකයන්ගේ බාහ්‍යාර්ථ අනුමේයවාදය මූලක වූ ධර්ම ක්‍ෂණ භංගුරත්වවාදී ආකල්ප ද, ***"ක්‍ෂණිකානං නාස්ති දෙශාන්තර ගමනං - යත්‍රෛවෝත්පත්තිඃ තත්‍රෛව විනාශඃ"*** **(නානායක්කාර, සනත්, 2003, *මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 65)** ප්‍රතික්‍ෂේප කරමින් නිර්මාණය වූ ධර්මතාවාදී චින්තනයක් ලෙස මාධ්‍යමක ශූන්‍යතාවාදය දැක්වේ. මෙහි දී සියලු පුද්ගලත්වවාදි ආකල්පයන් මෙන්ම ධර්මයන්ගේ ද අස්තිත්වය ප්‍රතික්‍ෂේප වන අතර, ඒ තුළින් ඔවුහු සර්ව ශූන්‍යතාවයක් ඉදිරිපත් කළහ. ***"අස්තීති ශාස්වතග්‍රාහො - නාස්තීත්‍යුච්ඡේද දර්ශනං, තස්මාදස්තිත්ව නාස්තිත්වෙ - නාශ්‍රීයතෙ විචක්‍ෂණඃ"*** **(*මූලමාධ්‍යමිකකාරිකා* - ශාසනරතන හිමි, මොරටුවේ, සංස්කරණය - 160 පිට)** ***"යඃ ප්‍රතීත්‍ය සමුප්පදඃ - ශූන්‍යතාං තාං ප්‍රචක්‍ෂමහෙ සා ප්‍රඥප්තිරුපාදාය් ප්‍රතිපත්සෙව මධ්‍යමා"*** **(*මූලමාධ්‍යමිකකාරිකා* - ශාසනරතන හිමි, මොරටුවේ, සංස්කරණය - 160 පිට)** එසේ වුව ද මෙම මාධ්‍යමක දර්ශනය තුළ ද වන්නා වූ දෝෂයක් වේ. එනම් සර්ව

ශූන්‍යත්වයක් ඉදිරිපත් වූ කල, එම ශූන්‍යත්වය පිළිබඳ විඥෙය ලැබීම හෙවත් අවබෝධය කෙසේ සිදුවේ ද, යන ගැටළුවයි. මෙම ඌණතාවය මගහරිනු පිණිස ඇති වූ ධර්මතාවාදී චින්තනයක් ලෙස යෝගාචාර විඥානවාදය දැක්වේ. ඒ තුළ සර්ව ශූන්‍යත්වය ප්‍රතික්ෂේපිත අතර, ඒ සඳහා බාහ්‍යාර්ථ ශූන්‍යත්වයක් ඉදිරිපත් වේ. ඒ තුළින් ඔවුන් පෙන්වා දෙනුයේ 'විඥාන', 'විඥෙය' යන පදාර්ථයන් තුළ විඥානයෙහි පැවැත්මත් 'විඥෙය' හි නිෂේධනයත් ය. මෙම පදනම මත යෝගාචාර දර්ශනයේ ඉගැන්වෙන්නා වූ මූලික සිද්ධාන්තය විඥප්තිමාත්‍රතාව හෙවත් චිත්තමාත්‍රතාව යි. එනම් ආනුභවික ලෝකය විඥානයෙන් පමණක් නිර්මාණය වූවක් බව දැක්වීමයි.

යෝගාචාර විඥානවාදී දර්ශනය විඥානවාදයක් දක්වා පෝෂණය කරන්නා වූ ආචාර්ය වසුබන්ධු පාදයන් විසින් රචිත විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය තුළ විඥානවාදීන්ගේ මෙම මූලික ඉගැන්වීම පිළිබඳ පූර්ණ විග්‍රහයක් දැකගත හැකිය. මෙම ග්‍රන්ථය ආරම්භ වන්නේ මුළු විෂය ලෝකයම විඥප්තිමාත්‍රයක් බව දක්වමිනි. යම් ආකාරයෙන් තිමිර රෝගයෙන් පෙළෙන මිනිසාට අසත් (සත්‍ය නොවූ) කෙස් ගුලියක්, චන්ද්‍ර මණ්ඩලයක් දර්ශනය වේද, ඒ ආකාරයේ සියලු දෘෂ්ටි විෂයයන් අසත්‍ය වීම නිසා සියල්ල විඥප්තිමාත්‍රයක් වේ. සිත හැරෙන්නට කිසිදු පදාර්ථයක් නොමැත. ***"විඥප්තමාත්‍රමෙවෙත - දසදථාව භාසනාත්, යථා තෛමිරිකස්‍යාසත් - කේශචන්‍ද්‍රාදී දර්ශනම්"*** **(ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, 1964, *විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය*, 01 ශ්ලෝකය, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, 145 පිට.)**

වසුබන්ධු පාදයන්ට අනුව බාහිර ලොව සංජානනය කරනු ලබන සිත හෙවත් විඥානය සත් වූවකි. නමුත් සංජානනයට පාත්‍ර වන්නා වූ විෂය වස්තුව සත් වූවක් නොවේ. එය පරිකල්පිතයකි. වසුබන්ධු පාදයන්ගේ යථෝක්ත අදහස ආර්ය ලංකාවතාර සූත්‍රයේ ද දැකගත හැකිය. ''තිමිර පටලයකින් වැසී ඇති, අක්ෂි රෝගයකින් පෙළෙන මිනිසා එම රෝගය කරණකොටගෙන අහසෙහි චන්ද්‍ර මණ්ඩලය දකියි. විෂය වස්තු පිළිබඳ බාලයන්ගේ ග්‍රහනය ඒ අයුරින්ම ක්‍රියාත්මක වෙයි. ***"සෙව චාස්‍ය භවේද්භ්‍රාන්තිරශුද්ධං තිමිරං යථා, කොශෝචන්‍ද්‍රකං තෛමිරිකො යථා ගෘහාති විභ්‍රමාත්, විෂයෙෂු තද්වද්වාලානං ගෘහණං සංප්‍රවර්තතෙ, කෙශොණ්චන්‍ද්‍රකප්‍රඛ්‍යමිදං මරීච්‍යුදකවිභ්‍රමම්."*** **(සද්ධර්මාලංකාවතාර සූත්‍ර)** කණ්නාඩිය තුළ, ජලය තුළ, ඇස තුළ, භාජනය තුළ, මැණික තුළ ප්‍රතිබිම්බ දක්නට ලැබෙයි. නමුත් ඒවා තුළ ග්‍රහණය කරගතහැකි කිසිවක් දක්නට නොමැත. අහසෙහි ඇති මිරිගුව මෙන් ලොව ඇති විවිධත්වය හුදු පෙනීමක් පමණි. ඒවා විවිධ ස්වරූපවලින් පෙනී සිටින බවත්, ඒවා වඳ ස්ත්‍රියගේ සිහිනයක් තුළ දිස්වෙන දරුවෙකු වැනි යැයි සඳහන් වේ. ***"දර්පණෙ උදකෙ භාණ්ඩෙෂු ච මණීෂු ච, බිම්බං හි උද්‍යතෙ තේෂු න ච බිම්බෝස්ති කුත්‍රචිත්, භාවාභාසං තයා චිත්තං මෘගතෘෂ්ණා යථා නභේ, තස්‍යතෙ චිත්‍රරූපෙණ ස්වප්නෙ වන්ධ්‍යෝරසෝ යථා."*** **(සද්ධර්මාලංකාර සූත්‍ර)** යථෝක්ත සියලු කරුණුවලින් සනාථ කරනුයේ අප දකින, ශ්‍රවණය කරන, රසවිඳින, ස්පර්ශ කරන භෞතික සත්තාවෙහි නිසරු භාවය යි. භෞතික ලෝකයෙහි ලබන සියලු අනුභූතීන් සිහින ලෝකයක අනුභූතීන්ට සමාන ය. ක්ලේශධර්ම සිහින ලෝකයෙහි මෙන්ම ප්‍රපංච ලෝකයෙහි ද දැකගත හැකිය. නිදසුනක් ලෙස සිහින ලෝකයේ දී අපට කවුරු හෝ පහර දෙයි ද, එවිට මනසෙහි ඇතිවන භීතියත් සැබෑ ලොවෙහි දී දඬුවමකට පරිවර්තනය වේ නම්, ඉන් ඇතිවන භීතියත් පෙන්වා දීමට පිළිවන. ඒ අනුව සිහිනලොව භීතියත් සැබෑලොව භීතියත් එකිනෙකට සමාන වේ.

සත්‍ය වශයෙන් නැති ලෝකයක් ඇතැයි පිළිගන්නා අපි ඇතැම් දෙයක ඇලෙමු. ඇතැම් දේ හෝ පුද්ගලයන් සමග ගැටෙමු. කැමති ප්‍රියජනක දේ ලබා ගැනීමට අපමණ වෙර දරමු. අකමැති අප්‍රියජනක දෙයට එරෙහි වෙමු. එහෙත් ලොව සියලු ක්‍රියාවන් අර්ථ ශූන්‍ය වේ. ලෝකය මායා

ස්වරූප වන බැවින් මෙම යථාර්ථ සත්‍ය නියම වශයෙන්ම අවබෝධ කරගත් තැනැත්තා සියලු බාධක වලින් මිදේ. ඒ අනුව විවිධ දුක් කම්කටොළුවලින්, අවුල් වියවුල්වලින් ගහන මෙම විෂම ලෝකය අප විසින්ම නිර්මාණය කරගත් මායාවකි. මිථ්‍යාවකි.

නමුත් සත්වාදී දාර්ශනිකයන් නිරන්තරයෙන් අවධාරණය කරන්නේ විෂය වස්තුවත් විඥානයත් දෙකක් ලෙසය. එම නිසා විෂය වස්තුවෙහිත් විඥ්ඥාණයෙහිත් ඇත්තා වූ වෙනස පිළිබඳ ඔවුහු බොහෝ සෙයින් සාකච්ඡා කොට ඇත. නමුත් විඥානවාදීන්ට අනුව විෂය වස්තුව හා ඒ පිළිබඳ විඥානය අතර වෙනසක් ඇතැයි පිළිගැනීමට නම් ඒ දෙක වෙන වෙනම ප්‍රත්‍යක්ෂ කිරීමට හැකි විය යුතුය. නිදසුනක් ලෙස, නිල් පැහැය හා නිල් පැහැය පිළිබඳ දැනුම යන අංශ දෙක අතර වෙනසක් පිළිගත හැක්කේ නිල් පැහැය හා ඒ පිළිබඳ දැනුම වෙන වෙනම ප්‍රත්‍යක්ෂයට ගොදුරු කර ගත හැක්කේ නම් පමණි. එහෙත් මේ දෙකම එක් ක්ෂණයකින් ඇති වෙයි. නිල් පැහැය දකින විටම නිල් පැහැය පිළිබඳ දැනුම ඇති වෙයි. නිල් පැහැය පිළිබඳ දැනුමෙන් ම නිල් පැහැය වටහා ගත යුතු වෙයි. එබැවින් මේ දෙක වෙන වෙනම වටහා ගැනීමේ ක්‍රමයක් නැත. අප විෂය වස්තුවක් ඇතැයි පිළිගන්නේ ඒ පිළිබඳ දැනුමෙනි. එම දැනුමට කලින් දැනුමට පදනම් වූ විෂය වස්තුව පැවතිණිදැයි අපි නොදනිමු. විඥානයත් විඥෙයයත් එකටම පහළ වේ නම්, විඥානයෙන් විඥෙයයේ අන්‍යතරත්වය වටහා ගන්නේ කෙසේද? ***"සකෘත් සංවෙද්‍යමානස්‍ය නියමෙන ධියාසහ විෂයස්‍ය තතොන්‍යත්වම් කෙනාකාරන සිද්ධ්‍යති"*** **(Pramāna Vārtika by Dharmakîrti.ed. R. Sāmskrtyāí, II, 338)**

විඥානවාදීන්ගේ අන්‍ය වූ සත්වාදීන්ගෙන් කියැවෙනුයේ ප්‍රත්‍යක්ෂ කරන ලද විෂය වස්තුව ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගයෙන් ස්වාධීනව පවත්නා බවයි. බාහිර ලෝකයේ විෂය පදාර්ථ සත්‍ය වශයෙන්ම පවතියි. විඥානයේ ප්‍රත්‍යක්ෂමය ක්‍රියාමාර්ගය මගින් විෂය වස්තුවට කිසිදු ආකාරයක බලපෑමක් නො කෙරෙයි. ප්‍රත්‍යක්ෂය ආලෝකයට සමාන කළ හැකිය. ආලෝකයෙහි අඳුරෙන් සැඟවී තිබෙන දේ දැකගත හැකිය. එම ආලෝකය ඊට කලින් අඳුරෙහි පැවති විෂය වස්තුවට කවරාකාර වූ හෝ බලපෑමක් නො කරයි. හුදෙක් නිරාවරණය කොට දැක්වීමක් පමණක් කරයි. ආලෝකය අමුතුවෙන් විෂය වස්තු නිර්මාණය නොකරයි. පවත්නා විෂය වස්තුවක් හෙළිකර දැක්වීම පමණක් ආලෝකය මඟින් සිදුවෙයි. එසේම ප්‍රත්‍යක්ෂයෙන් ද කෙරෙන්නේ විෂය වස්තුව පවත්නා සැටියෙන්ම විදහා දැක්වීමකි. කලින් ප්‍රත්‍යක්ෂ නොකළ විෂය වස්තුවක් ප්‍රත්‍යක්ෂ වනු ලැබීම හැර වෙනත් වෙනසකට පත්නොවී ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගයට ඇතුළු වෙමින් එහි අනන්‍යතාව ඒ අයුරින්ම පවත්වා ගනියි. (**The New Realism. P. 35.)** ප්‍රත්‍යක්ෂයෙන් විෂය වස්තුව නිරාවරණය වෙයි. නමුත් විෂය වස්තුවට එසේ නිරාවරණය වීමේ අවශ්‍යතාවක් නැත. විෂය වස්තුවේ ස්වභාවය තුළ එය ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගයකට යොමුකර වීමේ කිසිදු බලපෑමක් නැත. එබැවින් විෂය වස්තුව වූ කලී ඊටම අයත් ලක්ෂණයන් තුළ ස්වාධීනව පවතින්නකි.

සත්වාදීන්ගේ මෙම මතය ප්‍රතික්ෂේප කරමින් විඥානවාදින් පවසනුයේ ප්‍රත්‍යක්ෂයෙන් බාහිරව විෂය වස්තුව පැවති බව ඔප්පු කළ හැකි විය යුතු බවයි. එහෙත් විෂය වස්තුවක් කලින් පැවති බව ඔප්පු කළ නොහැකිය. ප්‍රත්‍යක්ෂ කිරීම තුළින්ම පමණක් එය සිදුකළ හැකිය. ප්‍රත්‍යක්ෂයට මුහුණ දීමෙන් අනතුරුව මිස ඊට කලින් විෂය වස්තුව අපට දත නොහැකි ය. එබැවින් විෂය හා විෂයි දෙකක් යන මතය ප්‍රතික්ෂේප වෙයි. ***"සංවෙදෙනන බාහ්‍යත්වම් අතෙර්ථස්‍ය න සිද්ධ්‍යති. සංවේදනාත් බාහිරත්වෙ ස එව නතු සිද්ධස්‍ය"*** **(Pramāna Varlikālankāra by prajńākaragupta ed. R. Sāmskrtyāna, patina, P. 32.)**

සත්වාදීහු විෂය වස්තුව හා ඒ පිළිබඳ දැනුම යන අංශ දෙක වෙන් වෙන්වූ සත්‍යතාවන්ය යන මතය ඔප්පු කිරීම සඳහා විවිධ තර්ක ඉදිරිපත් කරති. ඔවුන්ගේ එක් තර්කයක් වනුයේ විෂය වස්තු භෞතික ලක්ෂණයන්ගෙන් යුක්තය යනුයි. එහෙත් ප්‍රත්‍යක්ෂයට භෞතික ලක්ෂණ නැත. විෂය වස්තුවක් කුඩා හෝ මහත් විය හැකිය. දැඩි හෝ මෘදු විය හැකිය. ඒවා සාපේක්ෂ වශයෙන් එකිනෙකට ඈත් හෝ ළංවිය හැකිය. එහෙත් විඥානයක් ලොකු හෝ කුඩා, දැඩි හෝ මෘදු, දුර හෝ ළඟ යයි කියන්නේ නම් එය විහිළුවකි. විෂය වස්තුන්ට භෞතික විශේෂණ ඇතැයි යන සත්වාදී මතය විඥානවාදිහු ප්‍රතික්ෂේප කරති. මෙය විඥානවාදී ස්ථාවරය නිසිලෙස වටහා නොගැනීම නිසා සත්වාදීන් විසින් ඉදිරිපත් කරන ලද තර්කයකි. විඥානය විෂය වස්තුන් නිර්මාණය කරයි' යන විඥානවාදී මතයෙන් කියැවෙනුයේ විඥානය භෞතික වූ විෂය වස්තු නිර්මාණය කොට බාහිර ලෝකයට ප්‍රධානය කරන බව නොවේ. විඥානයේ එක් එක් ප්‍රකාරයක් අප විෂය වස්තුවක් ලෙස ග්‍රහණය කරමු. විඥානය සෑම මොහොතකම විවිධ වූ ප්‍රකාරයන් හෙවත් ආකාරයන් ප්‍රක්ෂේපනය කරයි. සමුදුරු දිය දහර තුළින් තරංග මතුව එන්නාක් මෙනි. විෂයවස්තු ලෙස වූ බාහිරත්වයක් ඒවාට ඇත ද, ඒවා හුදෙක් විඥානයේ ප්‍රකාරයෝම වෙති. මුහුදෙහි දියදහර හා තරංග අතර වෙනසක් විද්‍යමාන වුව ද තරංග වූ කලි දිය දහරින් වෙනස් වූවක් නොවේ. විෂය වස්තු ලෙස පෙන්වනු ලබන විඥාන ප්‍රකාරයන් නිර්මාණය වීමට වඩා අන්‍ය වූ කාර්යයක් විඥානයට නොමැත. ***"න ච විෂය ප්‍රතිභාසාත්ම උත්පත්තිම් මුක්ත්වා විඥාසෳානා්‍ය ක්‍රියාසති"*** ( **Madyānta vibhāga Sutrabhāsyatika. 1932, by Sthiramati, part 01, ed. V. Bhattacarya, P. 21.)**

මෙහි දී අප විසින් අවධාරණය කළ යුතු කරුණක් වන්නේ විඥානයේ සම්භවය විඥානවාදීන් හා සත්වාදීන් විසින් දෙයාකාරයකින් පිළිගෙන ඇති බවයි. සත්වාදීන්ට අනුව විඥානය නිරාකාරය. විඥානයට ප්‍රකාරයන් හෙවත් ආකෘති නොමැත. ආකෘති ලෙස අප ප්‍රත්‍යක්ෂ කරන්නේ විෂය වස්තුව සතු ඒවාය. මේවා ඍජුව හා අව්‍යවහිතව විඥානය මඟින් ප්‍රකට කරනු ලැබේ. එහෙත් විඥානවාදීන්ට විඥානය සාකාරය. විඥානයේ අකෘතිම විෂය වස්තු ලෙස පිළිගැනෙයි. විඥානයට අතිරේක වූ සත්තාවක් විඥානවාදීන් නොපිළිගන්නා බැවින්, ප්‍රත්‍යක්ෂ කරන ලද ආකෘති විඥානයට අයත් ඒවා විය යුතුය. විඥානය තමාගේම ආකෘතින් නිර්මාණය කරයි. විඥානයේ සංධාරය (අන්තර්ගතය) පිටතින් ආනයනය කරන ලද්දක් නොවේ. විඥාන අන්තර්ගතයෙහි පවත්නා වාසනා බීජ මුහුකුරා යමින් රූපාදී වශයෙන් ප්‍රතිභාසාත්මක වන විඥාන ප්‍රවෘත්තියම පමණක් දක්නට ලැබේ. ඒ හැර රූපාදි වූ විෂය වස්තු නැත. ***(ස්වබීජ පරිපාකාද් රූපාද්‍යාභාසම් විඥානම් පවතීතෙ තතු රූපාදීකොර්ථොස්ති)***

විඥානයේ කිසිදු බලපෑමකට යටත් නොවී විෂය වස්තුව ස්වාධීනවම පවතී යන සත්වාදී මතය ඛණ්ඩනය කෙරෙන තවත් සාධකයක් ලෙස ස්මෘතියේ ක්‍රියාකාරීත්වය විඥානවාදීන් විසින් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රත්‍යක්ෂ කළ විෂය වස්තුවක් යළි ස්මරණය කිරීමට අපට හැකි වෙයි. ප්‍රත්‍යක්ෂ කළ විෂය වස්තුවත්, ස්මරණය කෙරෙන විෂය වස්තුවත් අතර වෙනසක් නැත. හුදෙක් නිරාවරණය කිරීමේ කාර්යයට පමණක් විඥානය සීමා වේ නම්, කලින් ප්‍රත්‍යක්ෂ කළ විෂය වස්තුවක් යලි හඳුනාගන්නේ කෙසේ ද, එම විෂය වස්තුව කලින් අප ප්‍රත්‍යක්ෂ කළ එකක් බව අපට නොකිය යි. ඒ පිළිබඳව කිසිදු සළකුණක් විෂය වස්තුවේ නැත. විඥානය නිරාකාර වන විට ස්මෘතීන් ජනනය කිරීමට ඊට හැකියාවක් නැති වෙයි. එහෙත් සත්‍ය වශයෙන් ප්‍රත්‍යක්ෂ විෂය වස්තුවක් යළි ස්මරණය කිරීමට හැකිවීමෙන් ඔප්පු වන්නේ විඥානය හුදු නිරාවරණයට පමණක් සීමා නොවන බවයි. විඥානය

සාකාරවත් ය. ආකෘති නිර්මාණය කිරීමට විඥානයට හැකි වෙයි. මේ අනුව සත්වාදී මතය බැහැර කෙරෙන බව විඥානවාදීන්ගේ අදහසයි.

එසේම ස්වප්නයක දී අප දකින විෂය වස්තූන්ගේ ස්වභාවයට වඩා අප අවදියෙන් සිටින විට දකින විෂය වස්තූන්ගේ ස්වභාවයෙහි වෙනසක් නැති බව විඥානවාදීහු පෙන්වා දෙති. මේ අවස්ථා දෙකෙහිම විෂය වස්තු මානසික නිර්මාණයන්ටම අයත් වන බැවිනි. අපි ස්වප්නයෙහි දී ද අවකාශය තුළ ව්‍යාප්තිමත්ව කාලය තුළ ප්‍රවෘත්ත වන විෂය වස්තු දකිමු. එහෙත් ඒවා අනුභූතියට හසුවීමට වඩා අතිරේක වූ වාස්තවික සත්තාවක් ඒවාට නැත. විඥානවාදීන්ට අනුව ප්‍රබුද්ධ ලෝකයෙහි අපගේ අනුභූතීන්ගේ තත්ත්වය ද මීට වෙනස් නොවේ. ස්වප්නානුභූතියෙහි හා ප්‍රබුද්ධානුභූතියෙහි වෙනසක් නැත්නම් ඒ දෙක වෙන් කොට අප හඳුනා ගන්නේ කෙසේදැයි සත්වාදීහු අසති. ඔවුනට අනුව මේ අනුභූති දෙක අතර වෙනසක් තිබේ. අප ස්වප්නයෙන් අවදි වූ විට ස්වප්නානුභූතිය හුදු මානසික නිර්මාණයක් බව අපි අවබෝධ කරමු. එහෙත් ප්‍රබුද්ධ අනුභූතිය එසේ මානසික නිර්මාණයකැයි වටහා ගැනීමේ ක්‍රමයක් නැත. මේ හැර ප්‍රබුද්ධ අනුභූතියට ගොදුරු වන වස්තු ආනුභවික රීතීන්ට අනුකූලව පවතියි. ඒවා කිසියම් රටාවකට අනුව පවතියි. ස්වප්නානුභූතීන්ට එබඳු ආනුභවික නීතිරීති යටතේ පැවැත්මක් නැත. එබැවින් ආනුභවික විෂය වස්තුවල සත්‍යතාව පිළිගැනීමට සිදුවෙයි.

මෙහිලා විඥානවාදීන්ගේ පිළිතුර වන්නේ සත්වාදීන්ගේ ස්වප්නානුභූති විචාරය කිසිසේත් තම මතයට බලපෑමක් නොකරන බවයි. වෛඥානිකත්වය නීතිරීතීන්ට අනුගත වීම හෝ නොවීම තුළ පවතිතැයි අදහස් නොකළ යුතු ය. නිශ්චිත අවකාශයක් හා කාලයක් තුළ පවතිමින් ආනුභවික නීතිරීතීන්ට අනුගත වීම යමක සත්‍යතාව ඔප්පු කිරීමට සාධකයක් නොවේ. ස්වප්නානුභූතිය ද ඊට ආවේණික වූ නීතිරීති යටතේ පවතියි. ස්වප්න සංසිද්ධීන් වුවද හැම තැනම හැමවිටම සිදු නොවේ. විඥානවාදීන්ට අනුව මේ දෙකෙහි විවිධත්වය පවතින්නේ සත්‍යතාවේ ප්‍රමාණාත්මක වෙනස්කම් අනුව ය. ස්වප්නය සාපේක්ෂ වශයෙන් ප්‍රබුද්ධ අනුභූතියට වඩා සත්‍යාවෙන් හීනය. අනුභූතියක් අත්විඳුනතාක් එහි ඇති වෛඥනිකත්වය හඳුනාගත නොහැකි ය. ස්වප්නය මිථ්‍යාවක් ලෙස ගැනෙන්නේ ස්වප්නයෙන් අත්මිදුනු විට ය. එතෙක් එහි සත්‍යතාව අපි ප්‍රත්‍යක්ෂ කරමු. එසේම අපි ආනුභවිකය යි සලකන ලෝකයෙහි ජනතාව අවිද්‍යාව තුළ සිටින තාක් ආනුභවිකත්වයෙහි පවත්නා මායාත්මක බව වටහා ගනිතැයි අපේක්ෂා කළ නොහැකි ය. යෝගාචාර ශික්ෂණයෙහි දැඩි සේ නියුක්ත වන විශේෂිත පුද්ගලයන් පමණක් හැම දෙයක් ම වෛඥනිකයයි වටහා ගන්නා අතර ආනුභවික අනුභූතීන්හි පවත්නා මායාත්මක බව ද ඔවුහු අවබෝධ කරති. එබඳු පුද්ගලයන්ට පමණක් ලෝකය ස්වප්නයකට වඩා අමුතු නොවේ.

විෂය වස්තුව යනු එය ප්‍රත්‍යක්ෂ කරනුවට වඩා වැඩියමක් නොවේ යන විඥානවාදී මතය සත්වාදීන්ගේ දැඩි විවේචනයට ලක් වූවකි. ස්වප්නයක දී විෂය වස්තු විඥානයෙන් බාහිරව පෙනෙනු ලැබුණත් ඒවා විඥානයේම හුදු ප්‍රක්ෂේපනයන් බව ප්‍රත්‍යක්ෂ කළ නොහැකිය. මෙයම අප ප්‍රබුද්ධව දකින ආනුභවික ලෝකයට ද උපයෝගී කළ හැකි බව විඥානවාදීන්ගේ අදහසයි. සත්වාදීන් පවසන්නේ විඥානවාදී මතය ස්වප්නයේ හා ප්‍රබුද්ධ අනුභූතියේ මූලික වෙනස්කම් ඉක්මවා යන්නක් බවයි. ස්වප්නය හුදෙක් එය දකින පුද්ගලයාට පමණක් සීමා වූවකි. හැම දෙනාටම එකම විටක එකම සිහිනයක් දැකගත නොහැකිය. එහෙත් ප්‍රබුද්ධ අනුභූතියේ තත්ත්වය මීට වඩා වෙනස් ය. ***"බහු චිත්තාලම්බනීභූතං එකං වස්තුසාධාරණම්, තත් ඛලු නෛකචිත්ත පරිකල්පිතං"*** **(යෝග සූත්‍ර භාෂ්‍ය, පිට. 15.)** ආනුභවික ලෝකයේ විෂය වස්තුවක් ප්‍රත්‍යක්ෂ කිරීම එක් පුද්ගලයකුට පමණක් හිමි වූ

වරප්‍රසාදයක් නොවේ. එකම විෂය වස්තුව හැම දෙනාටම ප්‍රත්‍යක්‍ෂ කළ හැකිය. සිහිනයක දී මෙන් ආනුභවික විෂය වස්තු පෞද්ගලික අනුභූතියක් බවට පත් වේ නම්, අනුභූතීන් ලබන පුද්ගලයන්ගේ තරමටම ලෝක සමූහයක් පැවතිය යුතු ය. එමෙන්ම එක් කරුණක් ගැන දෙදෙනෙකුට අදහස් හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් ද නැති වනු ඇත. මෙහිලා විඥානවාදීන්ගේ මතය වන්නේ සත්වාදීන්ගේ ඊනියා පොදු ලෝකය යනු විවිධ චිත්තසන්තානයන්ගේ එකමුතුවක් පමණක් බවයි. පවතිනුයේ ලෝක සාම්‍යයක් පමණි. සෑම විඥානයක් ම තමාගේ ලෝකයක් නිර්මාණය කරයි. එක් කෙනෙකුගේ නිර්මිත ලෝකය හා තවත් කෙනෙකුගේ නිර්මිත ලෝකය ඇතැම් වැදගත් අංශවලින් සමාන වනු මිස සම්පූර්ණයෙන්ම සමාන නොවේ. සැබවින්ම ඇත්තේ  ලෝක සාම්‍යයකි. සත්‍ය වශයෙන් මේ ලෝකයෙහි උපලබ්ධ වන්නේ අනන්ත වූ බහුත්වයක් පමණි. විවිධ අනුභූතීන්ගේ ආංශික ඒකීයභාවයෙන් මෙම විෂම සමාජය ජනිතවෙයි. කෙනෙකුගේ ලෝකයට තවත් කෙනෙකුට ඇතුළත් විය නොහැකි බැවින් සුළු සුළු වෙනස්කම් සැලකිල්ලට නොගෙන අමතක කර දැමෙයි. තුලනය කර බැලීමට වෙනත් ක්‍රමයක් නොමැති බැවිනි.

ඥානය ස්වසංවේදීය හෙවත් තමා විසින්ම දැනගනු ලබයි යන විඥානවාදී මතයට එරෙහිව ද සත්වාදීන් විස්තර කරුණු දක්වා ඇත. සත්වාදීන්ට අනුව ඥානය එහි ස්වභාවයෙන්ම යමක් පිළිබඳ ඥානයකි. ඥානය හා යමක් අතර ඇති සම්බන්ධය සැබෑ සම්බන්ධයකි. ඥානය පමණක් පවත්නා එකම සත්තාව නම් ඥානයක් ඇතිවීමේ හැකියාව ද නැති වෙයි. ඉදින් නිල පිළිබඳ ඥානය හුදු සත්තාව නම් හා නිල් පැහැය එම ඥානය සමග තදාත්ම්‍ය වේ නම් එවිට ද්විත්ව කාර්යයක යෙදීමට සිදුවෙයි. එනම් ඥානයට එහි ආකෘතිය (විඥප්තිය) ක් ලෙස නිල් පැහැය ප්‍රක්ෂේපනය කරමින්ම එය නිල් පැහැය ලෙස දැනගැනීමට හැකි විය යුතුය. මෙය වෙනත් ලෙසකින් කිවහොත් විෂයී ලෙසත්, විෂය ලෙසත් එකවිට ක්‍රියාත්මක වීමට සිදුවෙයි. මේ දෙක අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ ය. එකම දෙය එකවිටම දැනගන්නා හා දැනගනු ලබන දෙය (ඥෙය) වන්නේ කෙසේ ද? මෙය හරියටම පොරව තමාවම කපාගන්නාක් මෙනි. සත්වාදීන්ගේ මෙම විවේචනයට පිළිතුරු දෙන විඥානවාදීන් සඳහන් කරන්නේ ඥානය යනු එය මඟින්ම ප්‍රක්ෂේපනය කරන ලද විශේෂිත අන්තර්ගතයක් ඇති එක් විඥප්තියක් යනුයි. එකම දෙය කෘත්‍ය දෙකක් එකවිට කිරීම පිළිබඳ විඥානවාදී මතයෙන් ප්‍රකාශ කරෙන්නේ විඥානයට තමාවම දැනගැනීමට හැකි වනු පමණක් නොව එය ඕනෑම ඥානයක් ඇති වීම සඳහා අවශ්‍යතාවක් ද වන බවයි. විඥානය විෂය-විෂයී බවට ද්විධාකරණය වෙයි. විෂයී විෂය පදාර්ථ දකිමින්ම එහි ඥානය ගැන ද දැනීමක් ඇතිකරගත යුතුය. මේ කොටස් තුන එකම දෙයක කොටස් හෝ අංග නොවේ. වාස්තවික වීමත් එම (විෂය) වස්තුව ගැන දැනීමත් එකම කෘත්‍යයකි. නිල් පැහැය පිළිබඳ දැනුම වෙනත් දැනුමක් මගින් දත යුතු නොවෙයි. එසේ දත හැකි ද නොවේ. සෑම දැනීමක් ම ස්වසංවේදී වෙයි. විඥානයේ එක් කෘත්‍යයක් අනතුරු කෘත්‍යය මඟින් දැනගත යුතු වේ නම් පූර්වක්ෂණය තවදුරටත් විඥානයක් යයි කිව නොහැකි ය. අනන්තර ක්ෂණය මගින් විඥානය ඇතිවන විට පූර්වක්ෂණය විනාශ වී ඇති නිසා ය. ඥාතෘ දැන ගන්නා විය යුතු ය. එවිට එය නැවත දැන ගත යුතු වීමේ අවශ්‍යතාව ද නැති වෙයි. ඥානය වූ කලී ස්වසංවේදී බැවිනි. ඥානය තමාවම ප්‍රකට නොකෙරේ නම් එය විෂය වස්තුවෙන් මුළුමනින්ම දුරුව සිටින්නක් විය යුතු ය. ආලෝකය විෂය වස්තු ප්‍රකට කරයි. නමුත් එම ආලෝකය වෙනත් ආලෝකයකින් ප්‍රකට කළ යුතු වෙයි නම් එම ආලෝකවත් කිරීමේ ව්‍යාපාරයෙහි අවසානයක් නැති වෙයි. එහි ප්‍රතිඵලය වන්නේ කිසිම දෙයක් නිරාවරණය නොවී පැවතීමයි. දැනීම යනු තත් ක්ෂණයෙහිම එම දැනීම පිළිබඳවම සංඥා සහගත වීමයි.

බාහිර විෂය වස්තූන්ගේ වාස්තවිකත්වය පිළිබඳ සංකල්පය බෙහෙවින් තහවුරු වූවකි. සාමාන්‍ය මනසට පුරුදු වී ඇත්තේ කිසිදු මානසිකත්වයකට සම්බන්ධ නැති වාස්තවික වශයෙන් සත්‍ය වූ විෂය වස්තු ඇත්ත වශයෙන්ම පවත්නා බව දැකීමට ය. එබැවින් සත්වාදී මතය පහසුවෙන් බැහැර කළ හැකි නොවේ. එහෙත් එය පසුතැවීමකින් තොරව ඉවතලිය යුත්තක් බව විඥානවාදීන්ගේ අදහස යි. ඔවුනට අනුව විෂයවස්තු වූ කලී විඥානයෙන් බැහැර වූ දේ ලෙස පෙනී යන නමුත් ඒවා නිසැකවම විඥානය මඟින් තමාගේම නිර්මාණයන් ලෙස ඉදිරිපත් කරන දේයි. ***(යදනත්තර් ඥෙයරූපම් තු බහිර්ත් අවභාසතෙ.)***

විඥප්තිමාත්‍රතා සංකල්පය තුළ යම් වස්තුවක් පිළිබඳ විඥානයක් විෂය අභාවයෙන් ගොඩනැගෙන්නේ නම්, එය ස්වප්නයේ දී පමණක් බව දක්වයි. විෂය සහිතව විඥානයක් ගොඩනැගෙන්නේ නම් එහි දී කරුණු 02ක් සම්පූර්ණ විය යුතු බව ඔවුන් දක්වයි.

01. ඉන්‍ද්‍රිය හා විෂය සන්නිකර්ෂණය

02. මනස මඟින් එහි දැනීම

මෙහි දී ප්‍රථම ක්‍ෂණයේ දී ඉන්‍ද්‍රිය මඟින් ඉන්ද්‍රියාර්ථ සන්නිකර්ෂණය සිදු වේ. දෙවනුව ක්‍ෂණයක් තුළ මනස මඟින් ඒ පිළිබඳ දැනීම් කාර්යය සිදුකරයි. ඉන්‍ද්‍රියාර්ථ සන්නිකර්ෂණය තුළ මනස මගින් කරන්නා වූ මෙනෙහි කිරීම සිදු නොවේ. මනස මගින් මෙනෙහි කරන විට ඉන්‍ද්‍රිය මඟින් වන්නා වූ විෂය අනුභූතිය ද සිදු නොවේ. එනම් ක්‍ෂණ දෙකක් එකට පහළ නොවන බැවිනි. මෙම නිසා ප්‍රත්‍යක්‍ෂයක් සිදුවිය නොහැක. ප්‍රත්‍යක්‍ෂයක් තුළ බාහිර වස්තුවේ අභාවය වන බැවින් සියලු බාහිර වස්තු අසත්‍ය වේ. එය මිත්‍යාවකි. හුදු විඥප්තියක් පමණි. ***"ප්‍රත්‍යක්‍ෂ බුද්ධිං ස්වප්නාදෞ - යථා සා ච යදා තදා- න සොඵෝ දෘෂ්‍යතෙ තස්‍ය - ප්‍රත්‍යක්‍ෂත්ව කතං මතම්," "උක්තං යථා තදාභාසා - විඥප්තිඃ ස්මරණං තතඃ - ස්වප්නෙ දෘග්විෂයාභාවං - නාප්‍රබුද්ධොවගච්ඡති," "අන්‍යොන්‍යාධිපත්‍යෙන - විඥප්තිනියමො මිථඃ - මිද්ධෙනොපහෘතං චිත්තං - ස්වප්නෙ තෙනාසමං ඵලම්"*** **(ඤාණසීහ හිමි, හේන්පිටගෙදර, 1964, විඥප්තිමාත්‍රතාසිද්ධිඃ, විංශතිකාකාරිකා, 16,17, 18 ශ්ලෝක, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, පිට. 146.)**

සියල්ල විඥප්තියක් වූ විට කිසිවෙකු විසින් තවත් කිසිවෙකු මරා දැමීම කෙබඳු වන්නේ ද? එහි දී ඇති වන්නා වූ පාපය කුමක් නිසා ඇති වේද? යන ගැටලුව ද විඥානවාදීන් හමුවේ ඇති වූ තවත් ගැටලුවකි. මෙයට පිළිතුරක් ලෙස විඥානවාදීන් දක්වන්නේ හිංසකයා සහ හිංසාවට ලක්වන තැනැත්තා පිළිබඳ හිංසා ක්‍රියාව වෛඥානිකත්‍වයට අදාළ වන බව යි. මෙහි දී හිංසකයෙක් හෝ හිංසාවට පත්වන තැනැත්තෙක් නොමැත. හිංසාව යනු එක් විඥප්තියකින් අනෙක් විඥප්තියට බලපෑමක් ඇති වීම යි. එක් විඥප්තියක් දෙවැනි විඥප්තිය කෙරෙහි බලපෑම් කරන විට ජීවිත විරෝධී ක්‍රියාවක් සිදුවිය හැක. එයින් ''සභාග සන්තති විච්ඡේදය'' සිදු වේ. එයට මරණය යැයි කියනු ලැබේ. මනසෙහි ශක්තියෙන් මනුෂ්‍ය ඝාතන ආදිය සිදුවන බව මෙයින් සනාථ කොට දක්වයි. පිශාචාදීහු මෙන්ම මනස දියුණු කළවුන් මානසික ශක්තියෙන් මිනිසුන්ට සිහින පෙන්වති. ***"මරණං පරවිඥප්ති - විශේෂාද් වික්‍රියා යථා, ස්මෘතිලොපාදිකාන්‍යෙෂාං - පිශාචාදිමානොවශාත්"*** **(ඤාණසීහ හිමි, හේන්පිටගෙදර, 1964, *විඥප්තිමාත්‍රතාසිද්ධිඃ, විංශතිකාකාරිකා,* 19 ශ්ලෝකය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, පිට. 146.)** භූතාවේෂ වීම් ආදිය සිදු කරති. වස්තුවක් නොමැති වූවත් මනස මගින් එම සිද්ධීන් සිදු කරන බව මෙහි දක්වා ඇත. එහෙයින් හිංසනාදී ක්‍රියාවන් වෛඥානිකත්‍වය තුළ අර්ථවත් වන බව විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි දක්වා ඇත. ***"තථා පරවිඥප්තිවිශෙෂාධිපත්‍යාත් පරෙෂාං***

***ජීවිතෙන්ද්‍රියවිරොධිනි කාචිද් වික්‍රියොත්පද්‍යතෙ, යයා සභාගසන්තතිවෙඡදාඛ්‍යං මරණං භවතීති වෙතදිතව්‍යම්."*** (**ඤාණසීහ හිමි, හේන්පිටගෙදර, 1964, *විඥප්තිමාත්‍රතාසිද්ධිඃ, විංශතිකාකාරිකා භාෂ්‍යය,* 19 ශ්ලෝකය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, පිට. 155.**)

මෙහි දී වසුබන්ධු හිමියන් ඉදිරිපත් කරනු ලබන වැදගත් අදහසක් නම් දන්නා දෙය මෙන්ම දන්නා තැනැත්තා යනු දෙකක් නොව එකම සත්තාවක් යන්න ය. (**වික්‍රමසිංහ අනුර එන්. 2007, මහායාන බුදු දහමේ සමකාලීන අදාළත්වය, භාග්‍යයා - ගංගොඩ, පිළිමතලාව. පිට. 45**) මෙම අවස්ථාද්වයම විඥානයෙන් ප්‍රභවයවන බව ඔහුගේ මතය යි. විඥානයෙහි පහළවීමෙන් ඉහත අවස්ථාද්වයම පහළවන අතර, එම අවස්ථාවන් යථාර්ථවත්ව අවබෝධ කිරීමෙන් බුද්ධත්වයට පත්විය හැකි බව සඳහන් කොට තිබේ. ඒ අනුව සියල්ල විඥානයෙහි යම් යම් ස්ථරයන් පදනම් ව බිහිව ඇත. සිහිනය එහි එක්තරා ස්ථරයක් වන අතර, අවදි වූ පමණින් එය අවබෝධ වෙයි. ලෞකිකත්වය අවබෝධ කරගත හැක්කේ ලෝකෝත්තර තත්වයට පත් වූ පසුය. ලෞකික ලෝකයෙහි සම්භවය වන සියලු දුක්වේදනා ලොකෝත්තර තත්වයේ දී නිෂේධනය වෙයි. අප ලෝකෝත්තරත්වය අවබෝධ කර නොගැනීමෙන් ලෞකික ලොව අසාර වූ ප්‍රපංචයන්ගෙන් කැළඹී ඇත. එබඳු පසුබිමෙන් මිදීමට ලංකාවතර සූත්‍රය සහ විඥප්තිමාත්‍රතාවාදය ප්‍රකාශ කරනුයේ ආලය විඥානයෙහි වූ ක්ලේශයන් නැතිකර දැමීම ය.

ස්ථිරමති ආචාර්යන් වසුබන්ධුගේ විඥප්තිමාත්‍රතා සිද්ධිවාදයට තිංශතිකාව රචනා කරමින් මිනිසුන් මායාත්මක ලෝකයකින් ආවරණය වී සිටීමට දුක්ඛ සම්භවයට මුල් වන්නා වූ කාරණාද්වයක් ඉදිරිපත් කරයි, එනම් ආත්මෝපචාරය සහ ධර්මෝපචාරය යි. ***"ආත්මධර්මෝපචාරෝහි - විවිධො යඃ ප්‍රවර්තතෙ, විඥානපරිණාමෙ සෞ - පරිණාමඃ සච ත්‍රිධා"*** (**ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය - විශංතිකාව, ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ , 1964, පිටු 159.**) ක්ලේශාවරණ සහ ඥෙයාවරණ ප්‍රහීණ නොකිරීමෙන් යථෝක්ත උපචාර උද්ගත වෙයි. ක්ලේශාවරණ සහ ඥෙයාවරණ ප්‍රහීණ කිරීමට අවස්ථාද්වයක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එනම්,

i. පුද්ගල නෛරාත්මය
ii. ධර්ම නෛරාත්මය

පුද්ගල නෛරාත්මය හෙවත් පුද්ගලයා ආත්මීය වශයෙන් නොගැනීමෙන් පුද්ගල නෛරාත්මය මතුවන අතර, ඉන් සක්කාය දෘෂ්ටිය ප්‍රහීණ වෙයි. ධර්මය ආත්මීය වශයෙන් නොගැනීම හෙවත් ධර්ම නෛරාත්මයෙන් අවිද්‍යාව ප්‍රහීණ වෙයි. සක්කාය දෘෂ්ටිය සහ අවිද්‍යාව දුරුවීම කරණකොට මායාමය ලෝකයෙන් මිදීමත් යථාර්ථයේ පිබිදීම නම් බුද්ධත්වය අවබෝධ වෙයි. ක්ලේශාවරණයෙන් සිදුවනුයේ කෙලෙස් ආවරණය කිරීමයි. ඥෙයාවරණයෙන් සිදුවනුයේ නුවණ ආවරණය කිරීම යි. ඉහත අවස්ථාද්වයම යථාර්ථයට විරුද්ධ ය. යෝගාචාරීන් පුද්ගල සහ ධර්ම ආත්මීය වශයෙන් නොගැනීමෙන් මුල් බුදුසමයෙහි විග්‍රහයට පැමිණ තිබේ.

ප්‍රමුඛ පදඃ ධර්ම, චිත්ත, ආවරණ, ආත්ම, ස්වභාව